# පිළිතුරු පත්‍රය

# ක්‍රිස්තියානි ධර්මය - 8 ශ්‍රේණිය

## I කොටස

01. - iii මිනිසාට ය.
02. - ii දේව කැමැත්තයි.
03. - ii මාරා
04. - iii දේව රාජ්‍යය
05. - i ලෙවි
06. - ii නාසරෙත්හි දේහනය
07. - iii ධර්මදූත මෙහෙවර
08. - i එලිසා ඇග්නිව්
09. - ii අතිගරු ඇන්ඩෘ කුමරාගේ හිමිපාණෝ
10. - iii ඔබට ලැබෙන වගකීම්වලින් ඉවත්වීම
11. - iii සාකෙවුස්ගේ නිවසේ දී ය.
12. - vi නායින් නුවර මළවුන්ගෙන් උත්ථාන කිරීම.
13. - v ලාදුරු රෝගියාට සුවය
14. - ii යායිරස්ගේ දියණියට සුවය
15. - i වික්කල් බිහිරකුට සුවකල අවස්ථාව
16. - අසත්‍යයි
17. - සත්‍යයි
18. - සත්‍යයි
19. - අසත්‍යයි
20. - සත්‍යයි

## II කොටස

01. i. තමන් වහන්සේගේ ස්වරූපය අනුව හා උන්වහන්සේට සමාන ලෙසට

ii. හොඳ නරක අවබෝධ කරගැනීමේ ගස - දේව කැමැත්තයි.
සර්පයා - නපුර

iii. ඉශ්‍රායෙල් ජනතාවට ඔරොත්තු නොදෙන තරම් බරවැඩ ගෙන පීඩාවට පත් කිරීම.
වින්නඹුවන් ලවා ඉශ්‍රායෙල් පිරිමි දරුවන් උපතේදීම විනාශ කිරීමට පෙළඹවීම.
හේබ්‍රෙව්වරුන්ට උපදින සෑම පිරිමි දරුවෙක්ම නයිල් ගඟට විසි කරන්නට අණ කිරීම.

iv. ලාදුරු රෝගීන් ඇතුළු රෝගීන් සුව කිරීමට
යක්ෂාත්ම දුරු කිරීමට
මළවුන් නැගිටවනු ලැබීම. **මින් පිළිතුරු දෙකක් සෑහේ.**

v. මරියා
- ජේසුතුමා පාමුලේ සිටීමට ප්‍රිය කළාය.
- උන් වහන්සේගේ වචනය ඇසීමට ප්‍රියවිය.
- යහපත තෝරා ගැනීම

මාර්තා
- ආගන්තුක සත්කාරයට කැමතිවිය.
- ලෞකික කටයුතු පිළිබඳ වඩාත් කැලඹිණි
- ඒ හේතුවෙන් අත්‍යවශ්‍ය දේ තෝරා ගැනීමට නොහැකි විය.

vi. ''ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය.''
''මරණයට පවා මුහුණ දීමට සූදානම්''

vii. ආත්මයාණන් මඟින් උපදෙස් දීමේ දීමනාව.
ආත්මයාණන් තුළ ධර්මය පහදා දිමේ දීමනාව.
ආත්මයාණන් තුළ විශ්වාසය.
ආත්මයාණන් තුළ සුව කිරීමේ වරම.
හාස්කම් කිරීමේ බලය.
දිවැස්වැකි කීමේ බලය.
ආත්ම විමසීමේ හැකියාව.
අන් භාෂා කතා කිරීමේ හැකියාව.
අන් භාෂා පහදාදීමේ හැකියාව. **මීන් දෙකක් සෑහේ.**

viii. අනාථ දරුවන් වෙනුවෙන් - ''ප්‍රීති නිවාසය'' සෑදීම.
වැඩිහිටියන් වෙනුවෙන් - ''සන්ධ්‍යාව'' නිවාසය සෑදීම.
''නංගි ගෙදර'' නමින් පාසලක් තැනීම.
ලෝක යුද්ධයෙන් පීඩා විඳි අය වෙනුවෙන් ''සාමයේ නිවාස'' තැනීම. **මීන් දෙකක් සෑහේ.**

ix. දේව වචනය ඇසීමට ඇති බාධා
මත්ද්‍රව්‍ය, ස්මාට් දුරකතන වලට ඇති ඇල්ම වැඩිවීම.
සොරකම, දුරාචාරය

x. මී මැස් මොර රෝගී දරුවාට සුවය දුන් අවස්ථාව.
ගායිරස්ගේ දියණියට සුවය ලද අවස්ථාව.

02. ( පාඩම 11 - ශුද්ධාත්මඵල වැඩිදුර අධ්‍යයනයට )

i. පාවුලුතුමා
ii. ප්‍රේමය/ ප්‍රීතිය / සාමය / ඉවසීම / කරුණාව / මෘදුකම / යහපත්කම / විශ්වාසවන්ත කම/ ආත්ම දමනය
iii. ඔබේ විරුද්ධවාදීන් ඔබට පීඩා කරන විට.
අසනීප, පවුල් අර්බුධ වලදී
ජීවිතයේ අවිනිශ්චිකතා වලදී
අන් අයගේ විවේචන එල්ලවන විටදී
පාසලේ දී, පන්තියේ දී, පල්ලියේ දී, ඕනෑම තැනකදී ඔබගේ අත්දැකීම මත දරුවන් ලියා ඇති පිළිතුරු වලට ලකුණු පවරන්න.

03. ( පාඩම 09 - ශ්‍රාවකයන්ගේ එඬේර සේවය )

i. සිමොන් පේදුරු
ii. මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න.
මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න.
මාගේ බැටළුවන් පෝෂණය කරන්න.
iii. පන්තිය තුළ නායකත්වය ලබමින්
තම කණ්ඩායමට නිවැරදි මග පෙන්වමින්
තම කණ්ඩායමට නිසි දිරිමත්වීම ලබාදෙමින්
යාච්ඤාව තුළින්
ජීවිතාදර්ශයෙන්

04. ( පාඩම 14 - දේව රාජ්‍යයේ වටිනාකම් )

i. පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමේ සිද්ධිය.

ii. අන් අයට වරද තැබීමට පෙර අප විසින් අප එකිනෙකා තුළ ඇති පාපයන් අවබෝධ කරගත යුතු බවයි.

iii. හැමදෙනාම එක ලෙස ආදරයෙන් පිළිගැනීම.
ස්වාමීන් වහන්සේගේ ගැලවීමේ පණිවිඩය ඔවුන් සමඟ බෙදා ගැනීම.
ජේසුතුමාව පිළිගැනීමට ඔවුන්ට මඟ පෙන්වීම.
පාපය ප්‍රතික්ෂේප කොට පව්කරුවා පිළිගැනීමට, ඔවුන්ට නිවැරදි මඟ පෙන්වීමට කටයුතු කිරීම.
දේව රාජ්‍යයේ වටිනාකම් ඔවුන් සමඟ බෙදා ගැනීම.

05. ( පාඩම 18 - උදාර මනුෂ්‍යත්වයක් )

i. ගරු මයිකල් රුදිගු පියතුමා
සේවක සාමුවෙල් සෙල්වරත්නම්තුමා

ii. ගරු මයිකල් රුදිගු පියතුමා

- වචනයෙන් දහම් දෙසීමට වඩා මනුෂ්‍යත්වයෙන් වඩාත් ලංවිය.
- ජනතාව සමඟ උරෙන් උර ගැටී ජීවත්විය.
- ජනතාවගේ පාරිසරික, සමාජයීය ගැටලු කෙරෙහි වඩාත් මානුෂියව කටයුතු කිරීම.

සේවක සාමුවෙල් සෙල්වරත්නම්තුමා

- දුප්පත් පිරිමි දරුවන්ට ආශ්‍රමයේ නැවතී සිට පාසල් යාමට අවස්ථාව සලසාදිම.
- එම දරුවන්ගේ වියහියදම් එතුමා විසින් දැරීම.
- 1958 දී මඩකලපුවේ ''කිරාන්'' නම් ස්ථානයේ හා චුන්නාක්කම් හි තවත් ආශ්‍රමයක් පිහිටුවීම කැපීපෙනේ.

iii. පීඩාවට පත් වූ දරුවෙක් කෙරෙහි මානුෂීයව, කටයුතු කරනු ලබන ආකාරය පිළිබඳව දරුවන් ලියා ඇති කරුණු 5කට පිළිතුරු පවරන්න.

06. ( පාඩම 19 - පංච පුස්තකය )

i. උප්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කතාව, ද්විතීය නීති සංග්‍රහය.

ii. 4 වන පනත - සබත් දවස ශුද්ධ කොට ගතකරන්න.
පනත සුරැකීමට කළයුතු දේ,

- ඉරු දින නොකඩවා දේව නමස්කාරයට සහභාගිවීම.
- ඉරුදින දේව මෙහෙය අතපසු කර බාහිර ක්‍රියාවල යෙදීමෙන් වැළකීම.
- උපරිම ලෙස දේව මහිමය උදෙසා සහ අන් අයගේ යහපත උදෙසා සබත් දිනය වැය කිරීම.

**මින් දෙකක් සෑහේ.**

iii. දරුවන් ලියා ඇති මඟ පෙන්වීම සඳහා ලකුණු ලබාදෙන්න. (වැඩිදුර අධ්‍යයනයට 19 පාඩමින් කරුණු ලබාගත හැකි ය.)
අන් අයගේ ජීවිත පමණක් නොව චරිත ද ආරක්ෂා කිරීම.
නිරතුරුවම දෙමව්පියන්ට ගරු කරමින් ඔවුන්ගේ අවවාද පිළිගැනීම.
ඉරු දින නොකඩවා දේව නමස්කාරයට සහභාගීවීම.
අන් අයසතු සම්පත් අයුතු ලෙස භාවිතයට නොගැනිම.
අන් අයගේ සම්පත් සුරැකීම.

07. ( පාඩම 20 - ආදි පියවරු )

i. ආබ්‍රහම් ඊසාක් ජාකොබ්

ii. ආබ්‍රහම් - දේව පියා පොරොන්දු තුන ලබාදීම.
ජාතීන්ගේ පියා
හේබ්‍රොන්හිදී දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම.

ඊසාක් - පිඩා හමුවේ සාමකාමී ප්‍රතිචාර දැක්වීම.
නැවත නැවත පීඩා පැමිණිය ද සුභවාදී ප්‍රතිචාර දැක්වීම.
ඒ තුළින් යහපත් විසඳුම් කරා ළඟාවීම.

ජාකොබ් - අප අතින් වන වැරදි පිළිගැනීමට සූදානම්වීම.
සහෝදර සහෝදරියන්ට ගරු කිරීම
පරිත්‍යාගශීලිව කටයුතු කිරිම.

iii. ජීවිත අභියෝග වලට සාර්ථකව මුහුණදීමට ඉන් පන්නරයක් ලැබේ.
පරිත්‍යාගශීලිව කටයුතු කිරීමට හැකිවීම.
සහෝදර ප්‍රේමයෙන් කටයුතු කළ හැකි වේ.
දෙවිඳුන් කෙරෙහි අචල විශ්වාසය.
පීඩා හමුවේ විසඳුම් ලැබීම.

සැකැස්ම - ක්‍රිස්ටින් ඩිනාලි රාජපක්ෂ
පාසල - අ/වලිසිංහ හරිශ්චන්ද්‍ර මහා විද්‍යාලය